# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.03.06 පැය 1335 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 398 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**බෝට්ටුවක් පෙරළී පුද්ගලයින් දෙදෙනෙකු මිය ගොස් දෙදෙනෙකු අතුරුදහන් වීම - යාපනය පොලිස් වසම.**

2026.03.06 වන අද දින උදෑසන කාලයේදී යාපනය පොලිස් වසමේ ගුරුනගර් ජැටිය ආසන්නයේ කලපු ප්‍රදේශයේ මඟින් ප්‍රවාහනය කරමින් සිටි ටෝලර් බෝට්ටුවක් පෙරළී යාමෙන් අනතුරක් සිදුව ඇති බවට යාපනය පොලිස් ස්ථානයට තොරතුරක් ලැබී ඇත.

අනතුරට ලක් වූ පිරිස පාලතිව් දූපතේ පිහිටි ක්‍රිස්තියානි පල්ලියක පැවැත්වීමට නියමිත පූජාවක් සඳහා ගුරුනගර් ජැටියේ සිට ටෝලර් බෝට්ටුවක් මඟින් ගමන් කර ඇති බවත් මෙම බෝට්ටුව මීටර් 50 ක් පමණ ගමන් කිරීමෙන් පසු බෝට්ටුව පෙරලී එහි සිටි පුද්ගලයින් දියේ ගිලී ඇති බවට අනාවරණය වී ඇත.

මෙම බෝට්ටුවේ පුද්ගලයින් 25 දෙනෙකු පමණ සිට ඇති බවට දැනට වාර්තා වී ඇති අතර ඉන් පුද්ගලයින් 23 දෙනෙකු මුදවා ගෙන ගොඩබිමට රැගෙන විත් අසාධ්‍ය තත්ත්වයේ සිටි 13දෙනෙකු යාපනය රෝහලට ඇතුලත් කර ඇති අතර ඉන් ප්‍රතිකාර ලබමින් සිටි දෙදෙනෙකු මිය ගොස් ඇත.

අනතුරට පත් පිරිස ප්‍රදේශවාසීන්, නාවික හමුදාව හා පොලිසිය එක්ව මුදවා ගෙන ඇත. මෙම අනතුරින් පුද්ගලයින් දෙදෙනෙකු අතුරුදහන් වී ඇති බවට අනාවරණය වී ඇති අතර නාවික හමුදා කිමිදුම් කණ්ඩායම් විසින් සෙවීමේ මෙහෙයුම් ආරම්භ කර ඇත.

යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන ආරම්භ කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**